සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department Of Education – Western Province**

**පළමුවන වාර ඇගයීම**
**முதலாம் தவணை பரீட்சை - 2018**
**First Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I , II | කාලය / காலம் / Time: පැය 02 යි. |

නම :-...................... ............................................. විභාග අංකය :-.....................

## I කොටස

- **1 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමි වේ.**


**01.** පහත වෙළදාම් දෙක අතරින් වඩා ලාභදායී වෙළදාම කුමක්දැයි තෝරා යටින් ඉරක් අඳින්න.

**(a)** රු. 300 ට ගත් ළමා කමිසයක් රු. 360 ට විකිණීම.

**(b)** රු. 400 ට ගත් ළමා ගවුමක් රු. 460 ට විකිණීම.

**02.** සංඛ්‍යා රටාවක සාධාරණ පදය $5n - 4$ වේ. එම රටාවේ 7 වන පදය සොයන්න.

**03.** ගණක රාමුවෙන් නිරූපිත ද්වීමය සංඛ්‍යාව දශමය සංඛ්‍යාවක් ලෙස දක්වන්න.





www.mathsland.org

**04.** පැය $1\frac{1}{2}$ න් $\frac{2}{5}$ ක අගය කීයද?

**05.** $P = \frac{1}{2}$ ද $q = \frac{-1}{3}$ නම් ද $8p - 6q$ හි අගය සොයන්න.

**06.** රූපයේ AB සරල රේඛාවක් නම් $x$ හි අගය සොයන්න.




**07.** සුළු කරන්න. $\frac{1}{3} + \frac{1}{4} - \frac{1}{2}$


**08.** රු. 1 200 000 ක් වටිනා මෝටර් රථයක් අලෙවි කිරීමේදී රු. 96 000 ක කොමිස් මුදලක් ගෙවීමට සිදුවුණි නම් මෙහිදී අයකර ඇති කොමිස් ප්‍රතිශතය සොයන්න.

**09.** සාධක සොයන්න $2x^2y + 6xy^2$

**10.** $5(x + y) - (x - y)$ ප්‍රකාශනය සුළු කරන්න.

www.mathsland.org


**11.** රූපයේ XY = XZ වන අතර XZ = YZ වේ. XY = 8 cm නම් XYZ ත්‍රිකෝණයේ පරිමිතිය සොයන්න.




**12.** ගෘහ භාණ්ඩයක් රු. 81 000 ට විකිණීමෙන් 8% ක ලාභයක් අත්විය. එහි ගත්මිල සොයන්න.

**13.** $7x - 2 = 12$ ප්‍රත්‍යක්ෂ ඇසුරෙන් විසඳන්න.

**14.** ගිනිකූරු වලින් සකස්කර ඇති පහත රටාවේ 12 වන අවස්ථාව සැකසීමට භාවිත කළයුතු ගිණිකූරු ගණන කොපමණද?




www.mathsland.org

**15.** සුළු කරන්න $3\frac{1}{4} \div 1\frac{1}{2}$

**16.** $98^2 - 2^2$ සාධක දැනුම භාවිතයෙන් අගය සොයන්න.


**17.** රූපයේ AB // CD නම් $x$ හි අගය සොයන්න.




**18.** පතුලේ වර්ගඵලය 200 $cm^2$ ක් වූ ඝනකාභ හැඩැති භාජනයක ජලය 1.8 $l$ ක් පුරවා තිබේ නම් භාජනයේ උස සෙන්ටිමීටර කීයද?

**19.** $(x + 3)(x - 2) = x^2 + \square\, x - \square$ හිස්තැනට සුදුසු අගයන් ලියන්න.

**20.** ABC ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.



**II කොටස**

- **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 4 ට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක්ද අනෙක් ප්‍රශ්න සඳහා එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද හිමි වේ.**

**01. (a)** සංඛ්‍යා පාද පිළිබඳ ඔබ ඉගෙනගත් විෂය කරුණු ඇසුරෙන් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(i)** ද්විමය සංඛ්‍යා යනු කුමක්දැයි ස්ථානීය අගය ඇසුරෙන් පැහැදිලි කරන්න.

**(ii)** දශමය සංඛ්‍යා ලියා දැක්වීම සඳහා යොදාගන්නා සංඛ්‍යාංක (ඉලක්කම්) ගණන කීයද?

**(iii)** ද්විමය සංඛ්‍යා ලියා දැක්වීම සඳහා යොදාගන්නා සංඛ්‍යාංක (ඉලක්කම්) මොනවාද?

**(b) (i)** 45 යන දහයේ පාදයේ (දශමය) සංඛ්‍යාව දෙකේ පාදයට (ද්විමය සංඛ්‍යාවලට) හරවන්න.

**(ii)** එම ද්විමය සංඛ්‍යාව ගණක රාමුවක් මඟින් නිරූපණය කරන්න.


**(iii)** $110101_{දෙක}$ යන ද්විමය සංඛ්‍යාව දහයේ පාදයට (දශමය සංඛ්‍යා බවට) හරවන්න.

**(iv)** අගය සොයන්න. $1101_{දෙක} + 111_{දෙක}$

**(v)** අගය සොයන්න. $1101_{දෙක} - 110_{දෙක}$

www.mathsland.org

**02. (a)** පැත්තක දිග මීටර $x$ වූ සමචතුරස්‍රාකාර මල් පාත්තියක රූප සටහනක් පහත දැක්වේ.




**(i)** මල් පාත්තියේ දිග මීටර 3 කින් වැඩිකර පළල මීටර 2 කින් අඩුකර අලුත් මල් පාත්තියක් සකස් කරනු ලැබේ. එම මල් පාත්තියේ රූප සටහනක් ඇඳ එහි දිග හා පළල $x$ ඇසුරෙන් ලියා දක්වන්න.


**(ii)** අලුතින් සකස්කල මල් පාත්තියේ වර්ගඵලය සඳහා ප්‍රකාශනයක් ලියා සුළු කරන්න.

**(b)** පහත දී ඇති ප්‍රකාශනවල සාධක සොයන්න.

**(i)** $x^2 - 9x + 20$

**(ii)** $16\,\mathrm{m}^2 - \mathrm{n}^2$

**03. (a)** පහත දී ඇති රූප සටහන ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**(i)** රූපයේ දක්නට ලැබෙන සමාන්තර රේඛා යුගල් නම් කරන්න.


**(ii)** මෙහි දක්නට ලැබෙන තීර්යක් රේඛා ගණන කීයද?

**(iii)** සමාන්තර රේඛා යුගලයක් තීර්යක් රේඛාවකින් ඡේදනය වීමෙන් සෑදෙන කෝණ අතර පවතින සම්බන්ධතා තුනක් ලියා දක්වන්න.

**(iv)** $x$ , y හා z යන ඉංග්‍රීසි අක්ෂර වලින් දක්වා ඇති කෝණවල විශාලත්වය සොයන්න.

www.mathsland.org

**(b)** දී ඇති රූපයේ $A\hat{B}C = A\hat{D}C$ නම් $E\hat{D}F = G\hat{B}H$ බව සාධනය කරන්න.




**04.** පුද්ගලයෙක් තම මාසික වැටුපෙන් $\frac{1}{3}$ ක් ආහාර සඳහා ද $\frac{1}{4}$ ක් ගෙවල් කුලී සඳහා ද වැය කරයි.

**(i)** ඔහු ආහාර හා ගෙවල් කුලී සඳහා වැයකළ මුදල මුළු වැටුපෙන් කවර භාගයක්ද?

**(ii)** ඔහු ආහාර හා ගෙවල් කුලී සඳහා වැය කළ පසු ඉතිරි වූ කොටසින් $\frac{3}{5}$ ක් වෙනත් වියදම් සඳහා වැය කරයි නම් වෙනත් වියදම් සඳහා වැය කළ මුදල මුළු වැටුපේ භාගයක් ලෙස දක්වන්න.

**(iii)** ඉහත වියදම්වලින් පසු ඉතිරි මුදල ඔහු බැංකුවේ තැන්පත් කරයි නම් බැංකුවේ තැන්පත් කළ මුදල වැටුපෙන් කවර භාගයක්ද?

**(iv)** බැංකුවේ තැන්පත් කළ මුදල රු. 6 000 ක් නම් ඔහුගේ මාසික වැටුප කොපමණද?

**05. (a)** ගෘහස්ත වතුර ටැංකියක දිග 1.6 m ක් ද පළල 1m ක් ද උස 80 cm ක් ද වේ.

**(i)** ටැංකියේ පරිමාව ඝන සෙන්ටිමීටර කොපමණද?

**(ii)** ටැංකියේ ධාරිතාව ලීටරවලින් ප්‍රකාශ කරන්න.

**(iii)** පුද්ගලයකු දිනකට ජලය ලීටර් 80 ක් පමණ භාවිතා කරයි. සාමාජිකයන් හතර දෙනෙකු සිටින නිවසකට මෙම ජල ටැංකියේ අඩංගු ජල ප්‍රමාණය දින කීයකට සෑහේද?

**(b)** එළකිරි එකතු කරන මධ්‍යස්ථානයකට දිනකදී එකතු වූ කිරි පරිමාව $0.5\ m^3$ කි.

**(i)** එම කිරි ප්‍රමාණය ලීටර කොපමණද?

**(ii)** එම කිරි ප්‍රමාණය 250 m*l* ක ධාරිතාව සහිත බෝතල් කීයකට ඇසිරිය හැකිද?

**06. (a)** ලී අල්මාරියක නිෂ්පාදන වියදම රුපියල් 30 000 කි. නිෂ්පාදකයා 20% ක ලාභයක් ලැබෙන සේ අල්මාරිය විකිණීමට මිල ලකුණු කරන ලද අතර අත්පිට මුදලට විකිණීමේදී 2% ක වට්ටමක් දීමට ද තීරණය කර ඇත. www.mathsland.org

**(i)** අල්මාරිය විකිණීම සඳහා ලකුණු කර ඇති මිල කීයද?

**(ii)** අත්පිට මුදලට අල්මාරිය විකුණන ලබන මිල කීයද?

**(iii)** අත්පිට මුදලට අල්මාරිය විකිණීමෙන් ලබන ලාභ ප්‍රතිශතය සොයන්න.

**(b)** අලෙවිකරුවකු ඉහත වර්ගයේ අල්මාරි පහක් එකක් රුපියල් 35 000 බැගින් විකුණා දීම සඳහා නිෂ්පාදකයාගෙන් 5% ක කොමිස් මුදලක් ඉල්ලා සිටියි. එම ගණුදෙනුව සිදුවුවහොත් අලෙවිකරුට ලැබෙන කොමිස් මුදල කොපමණද?

**07.** ධාවන තරඟයක් සඳහා පුහුණුවන ක්‍රීඩකයෙක් පළමු දින ක්‍රීඩා පිටියක් වටා වට 2 ක් ද දෙවන දින වට 5 ක් ද බැගින් දිනපතා වට තුන බැගින් වැඩි කරමින් ධාවනයේ යෙදෙයි.

**(i)** ක්‍රීඩකයා මුල් දින හතරේ ධාවනයේ යෙදෙන වට ගණන පිළිවෙලින් ලියා දක්වන්න.

**(ii)** දිනපතා ක්‍රීඩකයා ධාවනයේ යෙදෙන වට ගණන සංඛ්‍යා රටාවක් ලෙස ලියූ විට එම රටාවේ මුල් පදය හා පොදු අන්තරය කුමක්ද?

**(iii)** එම සංඛ්‍යා රටාවේ සාධාරණ පදය $(T_n)$ සඳහා ප්‍රකාශනයක් ලබාගන්න.

**(iv)** එමඟින් 10 වන දිනයේ දී ක්‍රීඩකයා විසින් ධාවනයේ යෙදෙන වට ගණන ගණනය කරන්න.

**(v)** ඔහු විසින් වට 20 ක් ධාවනයේ යෙදෙන්නේ පුහුණුවීම් ආරම්භ කර කීවන දිනයේ ද?


# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## පළමුවන වාර පරීක්ෂණය - 2018
## ගණිතය - 9 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| **01.** | $a$ | | ② |
| **02.** | $5 \times 7 - 4$ | 1 | |
| | 31 | 1 | ② |
| **03.** | $1011_{දෙක}$ | 1 | |
| | 11 | 1 | ② |
| **04.** | $\frac{3}{2} \times \frac{2}{5}$ | 1 | |
| | $\frac{3}{5}$ | 1 | ② |
| **05.** | $8 \times \frac{1}{2} - 6 \times (-\frac{1}{3})$ | | |
| | $4 + 2$ | 1 | |
| | 6 | 1 | ② |
| **06.** | $x + 60^\circ + 90^\circ = 180^\circ$ | 1 | |
| | $x = 30$ | 1 | ② |
| **07.** | $\frac{4+3-6}{12}$ | 1 | |
| | $\frac{1}{12}$ | 1 | ② |
| **08.** | $\frac{96\,000}{1\,200\,000} \times 100\%$ | 1 | |
| | 8% | 1 | ② |
| **09.** | $2xy\,(x + 3y)$ | | ② |
| **10.** | $5x + 5y - x + y$ | 1 | |
| | $4x + 6y$ | 1 | ② |
| **11.** | $8 + 8 + 8$ | 1 | |
| | 24 cm | | ② |
| **12.** | රු. $81\,000 \times \frac{100}{108}$ | 1 | |
| | රු. 75 000 | 1 | ② |
| **13.** | $7x - 2 + 2 = 12 + 2$ | 1 | |
| | $\frac{7x}{7} = \frac{14}{7}$ } | 1 | |
| | $x = 2$ } | | ② |
| **14.** | $3 + 2 \times 11$ | 1 | |
| | 25 | 1 | ② |
| **15.** | $\frac{13}{4} \times \frac{2}{3}$ | 1 | |
| | $\frac{13}{6}$ හෝ $2\frac{1}{6}$ | 1 | ② |
| **16.** | $(98 - 2)\,(98 + 2)$ | 1 | |
| | 9 600 | 1 | ② |
| **17.** | $x + 70^\circ + 80^\circ = 180^\circ$ | 1 | |
| | $x = 30^\circ$ | 1 | ② |
| **18.** | පරිමාව $= 1\,800\ cm^3$ | 1 | |
| | උස $= 9$ cm | 1 | ② |
| **19.** | $x^2 + \boxed{1}x - \boxed{6}$ | 1+1 | ② |
| **20.** | $\frac{1}{2} \times 12 \times 8$ | 1 | |
| | $48\ cm^2$ | 1 | ② |
| | | | 40 |

www.mathsland.org

### II පත්‍රය

| | | |
|---|---|---|
| **01. (a) (i)** | ස්ථානීය අගය දෙකේ බල ලෙස ලියූ සංඛ්‍යා | ② |
| **(ii)** | 10 | ① |
| **(iii)** | 0 හා 1 | ① |
| **(b)(i)** | $101101_{දෙක}$ | ③ |
| **(ii)** |  | ② |
| **(iii)** | 53 | ③ |
| **(iv)** | $10100_{දෙක}$ | ② |
| **(v)** | $111_{දෙක}$ | ② |
| | | 16 |

| | | | |
|---|---|---|---|
| **02. (a) (i)** |  | 1 | |
| | දිග – $(x + 3)$ | 1 | |
| | පළල – $(x - 2)$ | 1 | ③ |
| **(ii)** | $(x + 3)(x - 2)$ | 1 | |
| | $x^2 - 2x + 3x - 6$ | 1 | |
| | $x^2 + x - 6$ | 1 | ③ |
| **(b) (i)** | $x^2 - 4x - 5x + 20$ | 1 | |
| | $= x(x - 4) - 5(x - 4)$ | 1 | |
| | $= (x - 4)(x - 5)$ | 1 | ③ |
| **(ii)** | (4m – n) (4m + n) | 1+1 | ② |
| | | | 11 |

| | | | |
|---|---|---|---|
| **03. (a) (i)** | AB හා CD | | ① |
| **(ii)** | 4 | | ① |
| **(iii)** | • අනුරූප ∢ යුගල් සමාන වේ. | 1 | |
| | • ඒකාන්තර ∢ යුගල් සමාන වේ. | 1 | |
| | • මිශ්‍ර ∢ යුගල්වල ඓක්‍යය 180° වේ. | 1 | ③ |
| **(iv)** | $x = 100°$ y = 100° z = 120° | 1+1+1 | ③ |
| **(b)** | $A\hat{B}C = G\hat{B}H$ (ප්‍රතිමුඛ ∢ ) | 1 | |
| | $A\hat{D}C = E\hat{D}F$ (ප්‍රතිමුඛ ∢ ) | 1 | |
| | $A\hat{B}C = A\hat{D}C$ (දත්තය) | | |
| | $\therefore G\hat{B}H = E\hat{D}F$ වේ. (ප්‍රත්‍යක්ෂය) | 1 | ③ |
| | | | 11 |

| | | | |
|---|---|---|---|
| **04. (i)** | $\frac{1}{3} + \frac{1}{4}$ | 1 | |
| | $\frac{4+3}{12}$ | 1 | |
| | $\frac{7}{12}$ | 1 | ③ |
| **(ii)** | $\frac{5}{12}$ න් $\frac{3}{5}$ | 1 | |
| | $\frac{1}{4}$ | 1 | ② |
| **(iii)** | $\frac{7}{12} + \frac{1}{4}$ | 1 | |
| | $= \frac{7+3}{12}$ | 1 | |
| | $= \frac{10}{12}$ | | |
| | $= \frac{5}{6}$ | 1 | |
| | ඉතිරි කොටස $= \frac{1}{6}$ | 1 | ④ |
| **(iv)** | $\frac{1}{6} \rightarrow$ රු. 6 000 | 1 | |
| | මුළු වැටුප = රු. 6 000 × 6 | | |
| | = රු. 36 000 | 1 | ② |
| | | | 11 |

| | | | |
|---|---|---|---|
| **05. (a) (i)** | $160 \times 100 \times 80$ | 1 | |
| | 1 280 000 $cm^3$ | 2 | ③ |
| **(ii)** | $\frac{1\,280\,000}{1\,000}\ l$ | 1 | |
| | 1 280 $l$ | 1 | ② |
| **(iii)** | දිනකට ජල ප්‍රමාණය = 320 $l$ | 1 | |
| | දින ගණන = 4 | 1 | ② |
| **(b) (i)** | $0.5 \times 1\,000\ l$ | 1 | |
| | 500 $l$ | 1 | ② |
| **(ii)** | $\frac{500 \times 1\,000\ ml}{250\ ml}$ | 1 | |
| | 2 000 | 1 | ② |
| | | | 11 |

www.mathsland.org

| | | | |
|---|---|---|---|
| **06. (a) (i)** | රු. 30 000 $\times \frac{20}{100}$ | 1 | |
| | රු. 6 000 | 1 | |
| | රු. 30 000 + 6 000 | | |
| | රු. 36 000 | 1 | ③ |
| **(ii)** | රු. 36 000 $\times \frac{2}{100}$ | 1 | |
| | රු. 720 | 1 | |
| | රු. 36 000 – 720 | | |
| | රු. 35 280 | 1 | ③ |
| **(iii)** | $\frac{5\,280}{30\,000} \times 100\%$ | 1 | |
| | 17.6% | 1 | ② |
| **(b) (i)** | රු. 35 000 × 5 = රු. 175 000 | 1 | |
| **(ii)** | රු. 175 000 $\times \frac{5}{100}$ | 1 | |
| | රු. 3 750 | 1 | ③ |
| | | | 11 |

| | | | |
|---|---|---|---|
| **07. (i)** | 2 , 5 , 8 , 11 . . . | | ② |
| **(ii)** | මුල් පදය = 2 | 1 | |
| | පොදු අන්තරය = 3 | 1 | ② |
| **(iii)** | $T_1 = 3 \times 1 - 1$ | 1 | |
| | $T_2 = 3 \times 2 - 1$ | 1 | |
| | $T_n = 3n - 1$ | 1 | ③ |
| **(iv)** | 3n – 1 | | |
| | 3 × 10 – 1 | 1 | |
| | 29 | 1 | ② |
| **(v)** | 3n – 1 = 20 | 1 | |
| | 3n = 21 <br> n = 7 | 1 | ② |
| | | | 11 |